## උතුරු මැද පළාත් සභාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති උතුරු මැද පළාත් සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා මූල්‍ය ප්‍රකාශන

සමාලෝචිත වර්ෂයට අදාළ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දින වන විට විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) අනෙකුත් ගිණුම්

සමාලෝචිත වර්ෂයට අදාළව 2012 අප්‍රේල් 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | | 2011 වර්ෂයට අදාල | | | ඉකුත් වර්ෂවලට අදාලව |
|---|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i) | විසර්ජන ගිණුම් | 29 | 29 | -- | -- |
| (ii) | ආදායම් ගිණුම් | 21 | 21 | -- | -- |
| (iii) | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 57 | 45 | 12 | 01 |
| (iv) | වාණිජ අත්තිකාරම් ගිණුම් | 05 | 05 | -- | -- |
| (v) | අරමුදල් ගිණුම් | 03 | 02 | 01 | -- |
| (vi) | ප්‍රඥප්ති ගිණුම් | 05 | 04 | 01 | -- |
| (vii) | ස්වයං රැකියා චක්‍රීය ණය අත්තිකාරම් ගිණුම | 01 | -- | 01 | -- |
| | එකතුව | 121 | 106 | 15 | 01 |

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති.

පළාත් සභා අරමුදලේ සියළුම ආදායම් හා වියදම් මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.2.3 ගිණුම්කරණ අඩුපාඩු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව අනාවරණය කර ඇතත්, පළාත් සභාවේ විවිධ ආයතන වලට අදාළ 2011 දෙසැම්බර් 31 දිනට වූ රු.60,959,437 ක බැරකම්, ජංගම බැරකම් ලෙස සහ පළාත් සභාව ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පළාත් සභා අරමුදලින් මිලට ගෙන ඇති සියළුම වත්කම් හා කෙරගෙන යන වැඩවල වටිනාකම් වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන, අනුමත ප්‍රඥප්තියකින් ආවරණය වී ඇති හදිසි අවස්ථා අරමුදල මගින් ඉපයූ පොලී ආදායමින් රු.1,192,257 ක් පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල ආදායමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් එකී ප්‍රමාණයෙන් පළාත් සභා ආදායම වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) උතුරු මැද පළාත් සභාව විසින් ආරම්භ කර පවත්වාගෙන යන නමුත්, අනුමත ප්‍රඥප්තීන් මගින් ආවරණය නොවන අරමුදල් 03 ක වූ එකතු වටිනාකම රු.8,717,336 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර, එම මුදල එකී අරමුදල් පිහිටුවීමේ අරමුණු ඉටු කිරීම සඳහා යෙදවීමකින් තොරව පළාත් සභාව විසින් රඳවා ගෙන තිබුණි.

(ඇ) අනුමත ප්‍රඥප්තියකින් ආවරණය වී නොමැති පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වූ කෘෂි නිෂ්පාදන අලෙවි චක්‍රීය අරමුදලේ වූ රු.6,886,444 ක ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඉ) 2011 වර්ෂයේදී රණවිරු සේවා අරමුදලේ මුදල්, තැන්පතු ගිණුමක ආයෝජනයෙන් ඉපයූ රු.25,553 ක පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.2.4 නොසැසඳූ පාලන ගිණුම්.
------------------------------
පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.19,312,529 ක් වූ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අදාළ පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හර ශේෂය උපයෝගී ලේඛන අනුව රු.19,862,332 ක් වීමෙන් රු.549,803 ක නොසැසැඳුණු වෙනසක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව රු.794,755,053 ක් වූ තැන්පතු ශේෂය පොදු තැන්පත් පාලන ගිණුම අනුව (වැන්දඹු හා විශ්‍රාම වැටුප් දායක මුදල් මාරු කිරීම් හැර) රු.555,629,159 ක් වීමෙන් නොසැසඳුනු වෙනස රු.239,125,894 ක් විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව පළාත් සභා ආයතන විසින් අවකරණය කරගෙන වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල වෙත ප්‍රේෂණය නොකර රඳවාගෙන තිබුණු රු.23,497,250 ක් වූ දායක මුදල් පොදු තැන්පත් පාලන ගිණුම අනුව, රු.239,605,146 ක් වීමෙන් රු.216,107,896 ක නොසැසඳුණු වෙනසක් විය.

1.2.5 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

බැංකු සැසඳුම්

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක බැංකු ගිණුම් 06 කට අදාළව මාස 06 ක කාලයක් ඉක්මවා උපලබ්ධි වී නොතිබුණු රු.49,059,808 ක තැන්පතු සම්බන්ධයෙන් පසු විපරම් කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 05 ක බැංකු ගිණුම් 07 කට අදාළව නිකුත් කර මාස 6 ක කාලයක් ඉක්මවා ඇතත්, ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත්කර නොතිබුණු රු.2,200,217 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඩී) ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් 07 කට අදාළ රු.7,254,340 ක් වු හඳුනා නොගත් හර හා බැංකු ගිණුම් 07 කට අදාළ රු.4,590,145 ක් වූ හඳුනා නොගත් බැර සම්බන්ධයෙන් වූ ලැබීම් හා වියදම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

1.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සංවර්ධන, නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ ඒජන්සියට 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුල විවිධ ආයතනවලින් හා පුද්ගලයින්ගෙන් අයවිය යුතුව තිබුණු රු.5,550,007 ක් අයකර ගැනීමට සහ 2004 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලය තුළ විවිධ ආයතන හා පුද්ගලයින් වෙත ගෙවිය යුතුව තිබුණු රු.3,115,517 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

1.2.7 අග්‍රිම ගිණුම්.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ජනවාරි 23 දිනට නිරවුල් නොකළ රු.306,070,953 ක් වූ අග්‍රිම හර ශේෂයක් වූ අතර, ඉන් සියයට 69 ක් ඉක්මවූ රු.212,226,803 ක ශේෂයක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පියවිය යුතුව තිබුණි.

(ආ) 2010 වර්ෂයයේ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් ලෙස දක්වා තිබුණු එකතුව රු.8,280,079 ක් වූ ශේෂයන් 05 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පළාත් දෙපාර්තමේන්තු විසින් නිරවුල් නොකළ අග්‍රිම ශේෂයන් යටතේ දක්වා තිබුණි. වර්ෂ ගණනාවක සිට පැවත එමින් තිබුණු එකී ශේෂයන්හි නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.2.8 පොදු තැන්පත්.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.818,252,303 ක් වූ අතර, නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ ආයතන 06 කට අදාල රු.65,940,473 ක් වූ ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

නු

1.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්

සමාලෝචිත වර්ෂයට අදාළව නිකුත් කළ විගණන විමසුම් 24 කට 2013 ජනවාරි 23 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පොත්පත් හා ලේඛන නොපැවැත්වීම.

2009 සැප්තැම්බර් 01 දිනැති DMA/2009 (02) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව සමස්ත පළාත් සභාව සම්බන්ධයෙන් සහ පළාත් සභාවේ එක් එක් ආයතනය සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි.

(ඇ) තොරතුරු ඉදිරිපත් නොකිරීම

විධිමත් ප්‍රසම්පාදන කමිටු වාර්තා, බෙදා හැරීමේ ලේඛන, වැඩ නිමවුම් වාර්තා, පත්වීම් ලිපි හා පැමිණීමේ සහතික යනාදී තොරතුරු ඉදිරිපත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.3,979,502 ක් වූ ගෙවීම් සහ විවිධ පුද්ගලයින්ගෙන් ලැබී සේප්පුවේ තැන්පත් කර තිබුණු චෙක්පත් 09 කට අදාළ එකතුව රු.19,248,339 ක් වූ ලැබීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

1.2.10 අනුකූල නොවීම්.

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධි විධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පනත් | |
| (i) | 1979 අංක 07 දරන රජයේ ඉඩම් සන්තකය ආපසු ලබාගැනිමේ පනත | ගාලදිවුල්වැව ආයුර්වේද රෝහලට අයත් නිල නිවාසයක වසර 10 කට අධික කාලයක් පදිංචි වී සිටින අනවසර පදිංචිකරුවකු ඉවත් කර නොතිබුණි. |
| (ii) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 16 වගන්තිය | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් 2009 සහ 2011 වර්ෂවලට අදාළ සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් රු.1,687,616 ක් ගෙවා නොතිබුණි. |
| (iii) | 1980 අංක 46 දරන සේවා නියුක්ති භාර අරමුදල් පනතේ 16 වන ජේදය | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට ගෙවිය යුතු රු.473,614 ක් වූ දායක මුදල් ගෙවීම පැහැර හැර තිබුණි. |
| (ආ) | 2002 දෙසැම්බර් 09 දිනැති අංක එන්සීපී/2002/11 දරන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1 ජේදය | 1991 සිට 2011 වර්ෂය දක්වා ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 405 දෙනෙකුට අදාළ රු.6,835,012 ක ණය ශේෂය සහ ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් 35 දෙනෙකුට අදාළ රු.1,020,389 ක් වූ ණය ශේෂය මාසික ගිණුම් සාරාංශ මගින් හෝ මුදල් ගෙවීමෙන් හෝ වාරක හා පොලී ප්‍රේෂණය කිරීම මගින් හෝ නිරවුල් කිරීමට දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. |

(ඇ) මුදල් රෙගුලාසි 371 — 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළ සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් විවිධ කාර්යයන් සඳහා නිලධාරීන් වෙත ලබා දී තිබුණු රු.4,464,250 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ද, නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු.1,583,081,989 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.414,139,132 ක් විය.

2.2 ආදායම් හා වියදම්.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම්

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් |
| පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම් | | | | | | |
| බදු ආදායම් | 1,508,466 | 1,621,262 | (112,796) | 1,063,850 | 836,171 | 227,679 |
| බදු නොවන ආදායම් | 231,333 | 351,610 | (120,277) | 312,350 | 332,571 | (20,221) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන | 10,469,250 | 10,313,423 | 155,827 | 10,717,660 | 10,676,670 | 40,990 |
| එකතුව | 12,209,049 | 12,286,295 | (77,246) | 12,093,860 | 11,845,412 | 248,448 |

වියදම

| | 2011 | | | 2010 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් | රු. දහස් |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 6,553,681 | 6,576,552 | (22,871) | 6,830,734 | 6,379,727 | 451,007 |
| අනෙකුත් වියදම් | 1,727,563 | 1,620,050 | 107,513 | 1,809,077 | 1,556,948 | 252,129 |
| උප එකතුව | 8,281,244 | 8,196,602 | 84,642 | 8,639,811 | 7,936,675 | 703,136 |
| ප්‍රාග්ධන වියදම් | 3,443,630 | 2,506,611 | 937,019 | 3,798,048 | 3,494,801 | 303,247 |
| එකතුව | 11,724,874 | 10,703,213 | 1,021,661 | 12,437,859 | 11,431,476 | 1,006,383 |

පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.10,703,213,413 ක් වූ මුළු වියදමෙන් සියයට 77 ක් පුනරාවර්තන වියදම් වූ අතර, සියයට 23 ක් මූලධන වියදම් විය. ඉකුත් වර්ෂයේ රු.11,431,475,621 ක් වූ මුළු වියදමෙන් සියයට 69 ක් පුනරාවර්තන වියදම් වූ අතර, සියයට 31 ක් මූලධන වියදම් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ මූලධන වියදම සියයට 8 කින් පහත වැටී තිබුණි. ඉකුත් වර්ෂය පුනරාවර්තන වියදම ඉක්මවා සමාලෝචිත

වර්ෂයේ පුනරාවර්තන වියදම සියයට 8 කින් වැඩිවී තිබුණු අතර, එකී වැඩිවීම සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම ඉකුත් වර්ෂයේ මූලධන වියදමට වඩා අඩුවීම කෙරෙහි බලපා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව රජයේ ප්‍රදාන රු.10,313,423,130 ක් සමඟ පලාත් සභා ලැබීම් රු.1,927,872,272 ක් ද, උපයෝගී කරගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.10,703,213,413 ක් උපයෝජනය කර ඇතත්, පළාත් සභා ආදායම් වලින් හා මධ්‍යම රජයෙන් ලැබුණු එක් එක් ප්‍රදාන වලින් වර්ෂය තුළ සිදු කරනු ලැබූ වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකි ආකාරයේ ගිණුම් පරිපාටියක් පළාත් සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. එකී, හේතුව නිසා සමාලෝචිත වර්ෂයේ රු.1,583,081,989 ක් වූ අතිරික්තයට බලපා ඇත්තේ භාණ්ඩාගාර ප්‍රදාන වලින් වූ ඉතිරියද පළාත් සභා ආදායම් වලින් වූ ඉතිරියද යන්න විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.3 ආදායම් පරිපාලනය.
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත හා ඉකුත් වර්ෂවල අවසානයට හිඟ ආදායම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ශීර්ෂය | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| දේපළ පැවරීම් මත මුද්දර ගාස්තු | - | - | 256,020 |
| ව්‍යාපාර පිරිවැටුම් බද්ද | 29,766,884 | 18,877,787 | 43,914,744 |
| මෝටර් වාහන ආදායම් බලපත්‍ර | 2,238,236 | 5,769,544 | 4,994,613 |
| | 32,005,120 | 24,647,331 | 49,165,377 |

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු සහ මෝටර් වාහන බලපත්‍ර ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.38,000,000 හා රු.210,000,000 ක් වශයෙන් ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. තථ්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා තිබුණු අතර, එය පිළිවෙලින් රු.67,433,880 ක් හා රු.284,388,661 ක් වී තිබුණි. ආදායම් ගණන් දීමේ නිලධාරීන් විසින් මු.රෙ. 85(1) (ඇ) ප්‍රකාර හැකිතාක් තාත්වික හා නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට උත්සාහ කළයුතු වුවත්, එසේ කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

2.4 අත්තිකාරම් ගිණුම්වල සීමාවන් නොපිළිපැදීම

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 503 හා උතුරු මැද පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ රී.369 හි විධි විධානවලට අනුව කටයුතු නොකිරීම නිසා අත්තිකාරම් ගිණුම් විෂයයක වියදමේ උපරිම හර සීමාව රු.261,364 කින් ඉක්මවා තිබුණු අතර, විෂයයන් 03 ක අවම ලැබීම් සීමාව රු.3,259,424 කින් පහත වැටී තිබුණි.

2.5 මානව සම්පත් කළමනාකරණය.

2.5.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2011 දෙසැම්බර් 31 දින වන විට උතුරු මැද පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ | 689 | 468 | 221 | - |
| (ii) | තෘතීයික | 1528 | 1518 | 10 | - |
| (iii) | ද්විතියික | 2219 | 1411 | 808 | - |
| (iv) | ප්‍රාථමික | 2465 | 2012 | 453 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික) | 11 | 441 | - | 430 |
| | | 6912 | 5850 | 1492 | 430 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය.

| | සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | විදුහල්පති | 942 | 458 | 484 |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | ගුරු භවතුන් | 13629 | 12924 | 705 |
| (iii) | ගුරු සහායක | 1490 | 1407 | 83 |
| (iv) | සැලසුම්/ සංවර්ධන/ වැඩසටහන් සහකාර/ කළමනාකරණ සහකාර | 838 | 28 | 810 |
| (v) | පුස්තකාලයාධිපති | 12 | 5 | 7 |
| (vi) | සුළු සේවක | 742 | 104 | 638 |
| | | 17653 | 14926 | 2727 |
| | මුළු එකතුව | 24565 | 20799 | 3766 |

(ඇ) සමාලෝචිත වර්ෂයේදී උතුරු මැද පළාත් සභාව විසින් අතිකාල හා නිවාඩු දීමනා වශයෙන් රු.348,877,542 ක් ගෙවා තිබුණු අතර, ඉන් සියයට 81 ක් වූ රු.286,071,212 ක් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට අදාළ අතිකාල හා නිවාඩු දින දීමනා වී තිබුණි. එම දෙපාර්තමේන්තුවේ සියළු ශ්‍රේණිවලට අදාළ පුරප්පාඩු සංඛ්‍යාව 238 ක් වී තිබුණු අතර, පුරප්පාඩු තනතුරක මාසික අතිකාල හා නිවාඩු දින දීමනාව රු.100,164 ක් වැනි ඉහළ පිරිවැයක් ගෙන තිබුණි. එම දෙපාර්තමේන්තුවේ 3298 ක් වූ තථ්‍ය කාර්ය මණ්ඩලයේ මාසික ඒක පුද්ගල අතිකාල හා නිවාඩු දින දීමනා පිරිවැය රු.7,228 ක් වී තිබුණි.

2.5.2 නිශ්කාර්ය හා ඌන උපයෝජිත මානව සම්පත්.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් ස්ථාපිත කර තිබුණු ප්‍රවෘත්ති ඒකකය සඳහා 1989 පෙබරවාරි 08 දින සිට නිලධාරීන් 04 දෙනෙකු බඳවාගෙන තිබුණු නමුත් එකී තනතුරු මු.රෙ.71 ප්‍රකාරව අනුමත කර ගෙන නොතිබුණු අතර, එකී නිලධාරීන්ට වෙනත් කාර්යභාර පැවරීමකින් තොරව 2011 දෙසැම්බර් 31 දින දක්වා රු.9,432,880 ක් වූ වැටුප් හා වේතන ගෙවා තිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.1.1 හා 13.3 වගන්ති හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පර්පාටික රීති අංක 118 කෙරෙහි අවධානය යොමු නොකර 2000 ජනවාරි 07 දිනැති අංක 2000/4 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයට හා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට ද පටහැනිව හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ වැඩ බලන විදුහල්පතිවරු 48 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි

2.5.3 වෙනත් ආයතන වලට මුදාහල මානව සම්පත්.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උතුරු මැද පළාත් සභාවේ විවිධ ආයතනවල සේවක මණ්ඩලවලට අයත් නිලධාරීන් 04 දෙනෙකු වර්ෂයකට අධික කාලයක සිට මධ්‍යම රජයේ ආයතන වෙත මුදාහැර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේදීද එකී නිලධාරීන් වෙත වැටුප් හා දීමනා සේවක මණ්ඩලය අයත් ආයතන විසින් ගෙවා තිබුණි.

(ආ) පොළොන්නරුව අධ්‍යාපන කලාපයේ සේවය කළ ගුරුභවතුන් 09 දෙනෙකු අමාත්‍ය/මන්ත්‍රී කාර්ය මණ්ඩලවලට සහ ශ්‍රී ලංකා යුද හමුදා සේවයට අනුයුක්ත කර තිබුණු අතර, එකී නිලධාරීන් වෙත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේදී රු.2,976,584 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණු නමුත්, 2013 ජනවාරි 23 දින වන විටත් එකී මුදල් පළාත් සභාව වෙත ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ විදුහල්පති සේවයේ තනතුරු 90 ක හා ගුරු සේවයේ තනතුරු 229 ක පුරප්පාඩු පැවතියදී, ජාතික පාසල්, මධ්‍යම රජයේ ගුරු පුහුණු මධ්‍යස්ථාන, කලාප අධ්‍යාපන කාර්යාලය, ජාතික ශිෂ්‍යභට බලකාය හා අධ්‍යාපන කලාපය තුළ වූ පහසුකම් වැඩි පාසල් වෙත අවිධිමත්ව හා සේවා කොන්දේසි වලට පටහැනිව ගුරුවරුන් අනුයුක්ත කර තිබුණු අවස්ථා 29 ක් සෝදිසි විගණනයේදී අනාවරණය විය.

(ඈ) කැබිතිගොල්ලෑව, තඹුත්තේගම සහ ගලෙන්බිඳුනුවැව අධ්‍යාපන කලාපයන්හි පාසැල් වල සේවය කරමින් සිටි ගුරුවරු 08 දෙනෙකු අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල වෙත නිදහස් කර තිබුණු නමුත්, 2011 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගේ වැටුප් හා දීමනා වශයෙන් ගෙවන ලද රු.7,981,872 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්.

(අ) පහත වර්ග කර ඇති පරිදි සමහර භෞතික සම්පත්, නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | සංඛ්‍යාව/ වර්ග ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|
| | | රු. |

| | | | |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි | 02 | තක්සේරු කර නැත |
| (ii) | වාහන | 21 | -එම - |
| (iii) | යන්ත්‍රෝපකරණ | 55 | -එම - |
| (iv) | කාර්යාල උපකරණ | 36 | -එම - |
| (v) | වෙනත් | 02 | -එම - |
| | | 116 | |

(ආ) 2000 වර්ෂයේදි අඩක් නිමකරන ලද ගල්අමුණ මහා විද්‍යාලයේ දෙමහල් ගොඩනැගිල්ල 2011 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණයෙන් නිම නොකිරීම නිසා එහි බිම් මහලද ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්ක්‍රීයව පැවතුණි.

2.6.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2011 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ 2012 මාර්තු 15 දිනට පෙර සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පළාත් සභාවේ අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තු 04 ක් විසින් 2013 ජනවාරි 23 දින වන විටත් එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2.6.3 අයවීමට ඇති සේවක ණය.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ ණය ශේෂයන්හි එකතුව රු.732,673,032 ක් වී තිබුණි. ආයතන 24 කට අදාළව වර්ෂ 01 කට වැඩි කාලයක සිට පැවැත එන හිඟ හිටි ණය ශේෂයන්හි එකතුව රු.92,301,921 ක් බව නියැදි පරීක්ෂණ වලදී අනාවරණය විය.

(ආ) පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමට අදාළ හිඟුරක්ගොඩ කලාප අධ්‍යාපන කාර්යාලයේ තොරතුරු අනුව කාර්යාලයෙන් බැහැරට ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන්

2011 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු ශේෂය රු.3,434,994ක් වු අතර එකී ණය ශේෂයන් අවුරුදු 01 ත් 15 ත් අතර කාලයක සිට අයවීම් හිඟ හිට තිබුණි.

2.7 වාහන උපයෝජනය.
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමි නිලධාරීන් සංචිත වාහන භාවිතා නොකළ යුතු වුවත්, පළාත් සභාව සහ සභා ලේකම් කාර්යාලයේ ලේකම්වරයා වෙත අනුයුක්ත කර තිබුණු නිල වාහනයට 2011 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ලබාගෙන තිබුණු රු.167,850 ක ඉන්ධන දීමනාවට අමතරව ඔහු විසින් භාවිතා කර තිබුණු සංචිත වාහන දෙකක් සඳහාද 2011 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලය තුලදී ඇනවුම් 22 කින් රු.80,191 ක් වූ ඉන්ධන ලීටර් 1051 ක් ලබාගෙන තිබුණු බව ධාවන සටහන් අනුව නිරීක්ෂණය විය.

(ආ) පළාත් සභාවේ අමාත්‍යාංශ 02 ක් හා දෙපාර්තමේන්තුවක් ඇතුළු ආයතන 04 ක් විසින් භාවිතයේ යොදවා තිබුණු වාහන 18 ක ධාවන මාපකය අක්‍රියව පැවතුණි.

2.8 ද්‍රව්‍ය අක්‍රමිකතා/ අවිධිමත් ගනුදෙනු.
---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය ඉහළ ගුණාත්මක භාවයකින් යුතු බීජ පැකට් 3000 ක් පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙතින් රු.75,000 කට මිලට ගෙන තිබුණු නමුත්, එම බීජ ඇණවුම් කිරීමට පෙර එම ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුදු නිලධාරියකුගෙන් පිරිවිතර ලබා නොගැනීම හා ඇණවුමට ඇතුළත් බීජ වර්ග පිළිබඳ නියැදියක් ලබා නොගැනීම යනාදිය හේතුවෙන් ප්‍රතිලාභීන් විසින් එම බීජ ප්‍රතික්ෂේප කිරීම නිසා අවශ්‍ය බීජ නැවත මිලට ගැනීමට සිදුවී තිබුණි. එම බීජ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව පෞද්ගලික සැපයුම්කරුවකුගෙන් රු.210,000 කට මිලට ගෙන තිබුණි.

(ආ) රුපියල් මිලියන 3,592 කට ඇස්තමේන්තු කර තිබුණු ගංවතුර නිසා හානියට පත් මාර්ග 53 ක දුර කි.මී.175.73 ක් ප්‍රතිසංස්කරණය සඳහා විවෘත ටෙන්ඩර් කැඳවීමෙන් රජයට උපරිම වාසි ලබාගැනීමට කටයුතු නොකර, ඇස්තමේන්තු අගය රුපියල් මිලියන 05 කට වඩා අඩු ව්‍යාපෘති 741 කට බෙදා වෙන් කර සීමිත මිල ගණන් කැඳවා සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණු අතර, තෝරා ගත් කොන්ත්‍රාත්කරුවන් අතරින් එක් කොන්ත්‍රාත්කරුවෙකුට එකී

ව්‍යාපෘති වලින් සියයට 80 කට වඩා වැඩි ප්‍රමාණයක් ලබාදී තිබුණි. එසේම ව්‍යාපෘති 741 කට බෙදා වෙන් කිරීම හේතුවෙන් රුපියල් මිලියන 3.58 ක ටෙන්ඩර් මණ්ඩල දීමනා ගෙවීමට ද සිදු වී තිබුණි.

2.9 ආර්ථික නොවූ ගනුදෙනු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය සතුව ප්‍රමාණවත් වාහන 04 ක් තිබියදී කුලී පදනම මත වාහනයක් ලබා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු. 470,180 ක් වාහන කුලී ලෙස ගෙවා තිබුණි.

(ආ) පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කඩපනහ අලෙවි සංකීර්ණය ඉදි කිරීමේ ව්‍යාපෘතියේ උපදේශක සේවා උතුරු මැද පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ලබා නොගෙන 2011 වර්ෂයේදී එම සේවය පෞද්ගලික ආයතනයක් වෙතින් ලබාගෙන රු.313,800 ක් ගෙවා තිබුණි.

(ඇ) වර්ෂයේ අමුද්‍රව්‍ය අවශ්‍යතාවය පිළිබඳ නිසි පුරෝකථනයක් නොකර පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ පේෂකර්ම මධ්‍යස්ථානවල සහ වඩු පාසල්වල 2011 වර්ෂයේ ආරම්භක අමුද්‍රව්‍ය තොගය පිළිවෙලින් රු.8,109,272ක් සහ රු.7,201,762 ක් වශයෙන් තිබියදී වර්ෂය තුළ පිළිවෙලින් රු.13,004,774ක සහ රු.11,550,844 ක අමුද්‍රව්‍ය මිලට ගැනීම හේතුවෙන් වර්ෂය අවසානයේදී පේෂ කර්ම මධ්‍යස්ථානවල අමුද්‍රව්‍ය තොගය රු.17,638,040 ක්ද, වඩු පාසල්වල අමු ද්‍රව්‍ය තොගය රු.9,460,810 ක් ද ඉතිරි වී තිබුණි.

2.10 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 අගෝස්තු 31 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් වාහන සපයාලීම සඳහා විධිමත් ක්‍රමයක් සකසා ගන්නා තෙක් මාස 06 ක කාලපරිච්ඡේදයක් සඳහා පමණක් බදු පදනමට කුලී වාහන ලබාගැනීමට භාණ්ඩාගාර අනුමැතිය ලබා දී තිබුණු අතර, 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛයෙන් මාස 60 ක කාල සීමාවක් සඳහා මූල්‍ය කල් බදු ක්‍රමයට වාහන ලබාගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද, එකී චක්‍රලේඛවලට පටහැනිව 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ වසර 07 ක කාලයක් තුළදී සමුපකාර අමාත්‍යාංශය විසින් කුලී පදනමට වාහන 02 ක් ලබාගෙන ඒ සඳහා එකතුව රු. 4,048,835 ක වාහන කුලී ගෙවා තිබුණි.

(ආ) ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශයේ අරමුණු සහ කාර්යයන්ට අදාළ නොවන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවස්ථා 06 කදී රු.7,785,035 ක් ගෙවා තිබුණි.

(ඇ) නිවාස අළුත්වැඩියාවන් සඳහා නිවාස ලාභීන් 56 දෙනෙකු වෙත 2010 වර්ෂයේදී සමුපකාර ග්‍රාමීය බැංකුව විසින් ගෙවා තිබුණු රු. 4,200,000 ක නිවාස ණය ශේෂයන්ගෙන් අයවීම හිඟ හිට තිබුණු ණය වාරික වටිනාකම රු.241,371 ක් විය.

(ඈ) ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2009 සහ 2010 වර්ෂයන්හිදී ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නොසලකා සාවද්‍ය ඇස්තමේන්තු හා අවිධිමත් ගිවිසුම් මත ක්‍රියාත්මක කර තිබුණු ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අභාවයට ලක්ව තිබුණු වැව් නවීකරණය කිරීමේ ව්‍යාපෘතීන් ඒවා ක්‍රියාත්මක කිරීමේ, පාලනයේ හා අධීක්ෂණයේ දුර්වලතා මත අසාර්ථක වී තිබුණි. එම ව්‍යාපෘතිවලින් රුපියල් මිලියන 78.7 ක පාඩුවක් රජයට සිදු වී තිබුණු අතර, නිසි අධිකාරී බලයකින් තොරව ගෙවා තිබුණු රුපියල් මිලියන 31.2 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 2011 දෙසැම්බර් 31 දින වනවිට ද අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි.

2.11 මතභේදයට තුඩු දෙන ගනුදෙනු.

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 මැයි 01 දින සිට 2011 අප්‍රේල් 30 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් පළාත් සභා සහ සභා ලේකම් කාර්යාලය සඳහා ආරක්ෂක සේවා සැපයුම්කරුවකු තෝරා ගැනීමේ දී පඩිපාලක සභාවේ නියමයන්ට අනුකූල නොවන බව දක්වමින් ප්‍රසම්පාදන කමිටුව විසින් අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. ඉහළ මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයක් තෝරාගෙන තිබුණු නමුත් එකී ආයතනය 2011 මැයි 01 දින සිට 2012 අප්‍රේල් 30 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා අධීක්ෂක ආරක්ෂක නිලධාරියෙකු සඳහා ඉදිරිපත් කර තිබුණු මිල ගණන් පඩිපාලක සභාවේ නියමයන්ට අනුකූල වී නොතිබුණි. ප්‍රසම්පාදන කමිටුව විනිවිදභාවයකින් සහ අවංකභාවයකින් කටයුතු නොකර ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ආයතනය වෙත ආරක්ෂක සේවා සැපයුම් කොන්ත්‍රාත්තුව පිරිනමා එම කාල පරිච්ඡේදයට අදාළව රු.1,318,032 ක් ගෙවා තිබුණි.

(ආ) පොළොන්නරුව අධ්‍යාපන කලාපයේ පාසල් වල පුරප්පාඩුව පැවති විදුහල්පති තනතුරු 26 ක් සඳහා එකී පාසල්වල සේවය කළ ගුරුවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා විදුහල්පති හා නියෝජ්‍ය විදුහල්පති තනතුරුවල වැඩ බැලීම සඳහා කණිෂ්ඨ ගුරුවරුන් පත්කර තිබුණි.

2.12 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම ප්‍රමාදවීම නිසා සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සියට එරෙහිව එකී අරමුදල් විසින් පනවා තිබුණු රු.1,104,803 ක් වූ අධිභාර සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු නමුත්, දායක මුදල් නියමිත කාලය තුළ ගෙවීම ප්‍රමාද වීමට වගකිව යුතු නිලධාරීන්ගෙන් එකී මුදල් අයකර ගැනීම සහ ඔවුන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම ඒජන්සිය විසින් සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරය විසින් රු.3,993,541ක් වූ පෙර පාසල් උපකරණ මිලට ගැනීම අවස්ථා 06 කදී සිදු කිරීම නිසා එකී උපකරණ එකවර මිලට ගැනීම තුළින් ලබාගැනීමට තිබුණු ආර්ථික වාසිය සහ ප්‍රසම්පාදන හා තාක්ෂණ කමිටු 05 ක සාමාජිකයන්ට අතිරේකව කළ ගෙවීම වළක්වා ගැනීමෙන් ලබාගැනීමට තිබුණු ආර්ථික වාසිය ආයතනයට අහිමි කර තිබුණි.

(ඇ) උතුරු මැද පළාතේ විදුලිය නොමැති ගම්මාන වලට විදුලිය ලබාදීම සඳහා වූ දැව ඉන්ධන විදුලි උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් 2009 වර්ෂයේදී රු.2,396,800 ක් ද, 2011 වර්ෂයේදී රු.2,198,536 ක් ද වශයෙන් රු.4,595,336 ක් උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් වැයකර තිබුණු නමුත්, ශක්‍යතා අධ්‍යයනයක් නොකිරීම සහ දුර්වල සැලසුම් කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය මුළුමනින්ම අසාර්ථක වී තිබුණි.

(ඈ) ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයේදී රු.292,659,480 කට මිලට ගෙන තිබුණු සූර්ය ලන්තෑරුම් 20,000 ක් ක්‍රියාකාරීත්වයේ හා නිෂ්පාදනයේ දුර්වලතා, සැපයුම්කරු එකඟ වූ සේවාවන් ප්‍රතිලාභීන් වෙත ලබනොදීම සහ අධීක්ෂණයේ දුර්වලතා නිසා භාවිතයෙන් ඉවත්කර තිබුණු අතර, පහත නිරීක්ෂණයන් ද විය.

i. සූර්ය ලන්තෑරුම් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කර ඇති නමුත්, 2011 වර්ෂයේ මිලට ගත් සූර්ය ලන්තෑරම් 5000 ක් වෙනුවෙන් සැපයුම්කරුට රු.5,213,400 ක් ද, 2009 වර්ෂයේ මිලට ගත් ලැන්තෑරම් 4500 ක් වෙනුවෙන් සැපයුම්කරුට සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රු.8,216,214 ක් වශයෙන් රු.13,429,614 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම බදු මුදල් ආපසු අයකර ගැනීමට 2013 ජනවාරි 23 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී රු.30,000,000 ක ප්‍රතිපාදන සීමාව ඇතුළත සූර්ය ලැන්තෑරුම් මිලට ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු නමුත්, එකී

සීමාව රු.47,618,000 කින් ඉක්මවා රු.77,618,000 ක් ගෙවා සූර්ය ලන්තෑරුම් 5000 ක් මිලට ගෙන තිබුණි.

(ඉ) උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2010 සහ 2011 වර්ෂවලදී පළාත් සංවර්ධන සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන උපයෝගී කරගෙන තෝරා ගත් ප්‍රතිලාභීන් වෙත බෙදාදීම සඳහා ජල පෙරන 7500 ක් රු.80,640,000 ක් වැය කර මිලට ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් 2011 නොවැම්බර් මස සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් විය.

i. මිලට ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට පටහැනිව සිදුකර තිබුණි.

ii. ජල පෙරන 3268 ක් ප්‍රතිලාභීන් වෙත බෙදාහැර තිබුණු නමුත්, ජල පෙරනවල මල බැඳීම, ක්‍රියාකාරිත්වයේ දුර්වලතා, සැපයුම්කරු එකඟ වූ සේවාවන් ඉටු නොකිරීම යනාදිය හේතුවෙන් ප්‍රතිලාභීන් විසින් ඒවා භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඊ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩ සටහන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු පාසල් 400 ක් ආශ්‍රිතව කොම්පෝස්ට් නිෂ්පාදනය ප්‍රචලිත කිරීමේ වැඩ සටහන නියමිත පරිදි සැලසුම් නොකිරීම නිසා රු.180,000 ක මුදලක් සපයා ගැනීමට නොහැකි වීම මත මිලට ගෙන තිබුණු රු.1,014,850 ක් වටිනා භාණ්ඩ බෙදා හැරීම 2012 ජූලි මාසය තෙක් ප්‍රමාද වී තිබුණි. මේ නිසා ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) උතුරු මැද පළාත් සහා බල ප්‍රදේශයේ ගොවි ජනතාවට අවශ්‍ය කෘෂි ද්‍රව්‍ය පහසු මිලට සැපයීමේ අරමුණ සහිත පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි සංවර්ධන අත්තිකාරම් ගිණුම් කටයුත්ත සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.5,000,000 ක උපරිම වියදම් සීමාවන් පනවා තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී වියදම් කර තිබුණේ එම සීමාවෙන් සියයට 02 ක් වූ රු.101,488 ක් පමණි. එම නිසා අත්තිකාරම් කටයුත්තට අදාළ අවම ලැබීම් සීමාවට රු.2,622,878 කින් ළඟා වී නොතිබුණි. 2006 වර්ෂයට පෙර සිට අඛණ්ඩව ගිණුම්වල දක්වා තිබුණු රු.16,295 ක මාර්ගස්ථ මුදල් ශේෂය සමාලෝචිත වර්ෂයේදීද හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි.

(ඌ) 2010 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 06 ක උපයෝජනය සියයට 44 ත්, සියයට 103 ත් අතර පරාසයකින් වැඩිවී තිබුණි.

(එ) මහවිලච්චිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිතියම් සහ පරිපූරක ඉඩම් විස්තර ලැයිස්තුව අනුව මහවිලච්චිය ග්‍රාමීය රෝහලට අයත් අක්කර 13, රූඩ් 02, පර්චස් 30 කින් සමන්විත ඉඩමෙහි සිදු කර තිබුණු අනවසර ඉදිකිරීම් සහ භාවිතයන් සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය විසින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 14 වගන්තිය ප්‍රකාරව 2011 දෙසැම්බර් 31 දිනට රු.12,537,565 ක් වූ එකතු කළ අගය මත බදු නියමිත කාලය තුළ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ඔ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන ඒකකය මගින් තත්ත්ව පාලන කටයුතු කර ගැනීමට හැකියාව තිබියදී, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේදී රු.1,338,376 ක් වූ තත්ත්ව පාලන උපකරණ මිලට ගෙන තිබුණු අතර, පසුව ඒවා ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ තත්ත්ව පාලන ඒකකය වෙතම භාර දී තිබුණි. 2011 වර්ෂයේදී ද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව රු.2,587,340 ක් වූ තත්ත්ව පාලන උපකරණ නැවතත් මිලට ගෙන තිබුණි.

(ඕ) දිඹුලාගල අධ්‍යාපන කලාපයේ පාසල් නිල නිවාස 520 න් දැනට ගුරුවරුන් පදිංචි වී සිටින නිවාස 70 ක් සඳහා 1996 වර්ෂයේදි තක්සේරු කරන ලද රු. 75 ක් බැගින් වූ ආර්ථික කුලියක් 2011 වර්ෂයේදීද අයකරමින් තිබුණි. දීර්ඝ කාලයක සිට සම්පූර්ණයෙන් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවැති නිවාස 466 ක් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදී නොතිබීම හේතුවෙන් පාසල් නිල නිවාස 450 ක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ක) හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් වලට අයත් ගොඩ ඉඩම් හා කුඹුරු ඉඩම් අනවසර භුක්තිවිදීම් වලට නතුවී තිබුණත්, එකී ඉඩම්වල ඔප්පු හෝ හිමිකම් සහතික ලබාගෙන ඒවායේ ආරක්ෂාව තහවුරු කරගෙන නොතිබුණි.

(ග) හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල් නිල නිවාස 256 න් නිවාස 170 ක් සඳහා රු.500 ට අඩු ආර්ථික කුලියක් අයකරමින් පවතින අතර එම නිවාස දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා නොකිරීම ඊට හේතුව වුවත්, නිවාස අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වර්ෂ ගණනාවක සිට පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ලබාදී නොතිබුණි.

(ජ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගෘහාශ්‍රිත එළවලු වගා සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි සංවර්ධන සමූපකාර සමිති සාමාජිකයන් වෙත ලබාදීම සඳහා රු.1,225,000 ක මුදලක් වැය කර මල් බාල්දි 2500 ක් මිලදී ගෙන තිබුණි. ඒ සඳහා වූ රු.1,000,000 ක ප්‍රතිපාදන වලින් වෙනත් වියදම් දැරීමෙන් පසු ඉතිරි වී තිබුණු රු.778,701 ක ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවූ

බැවින් කෘෂි සංවර්ධන සමූපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ වූ ප්‍රතිපාදන වලින් සියයට 31 ක් ලබාගෙන තිබුණි.

2.13 කාර්ය සාධනය.

පළාත් සමාජ සේවා දෙපාර්මේන්තුවේ මෙහෙවර සහ ප්‍රධාන කාර්යයන් යටතේ නොගැනෙන අධ්‍යාපනයේ ප්‍රතිඵල ඉහළ නැංවීම උදෙසා 2011 අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිතව සිටි සිසුන් වෙනුවෙන් පැවැත් වූ සම්මන්ත්‍රණ සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වැය විෂයකින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 09 කදී රු.715,469 ක් ගෙවීම් කර තිබුණි.

2.13.1 රජයේ ප්‍රදාන.

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ රජයේ ප්‍රදාන සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ප්‍රභවය | ලැබී තිබුණු රජයේ ප්‍රදාන | උපයෝජනය | (අතිරික්තය) / ඌන උපයෝජනය |
|---|---|---|---|---|
| | | රු. දහස් | රු. දහස් | රු. දහස් |
| (අ) | උපමාන පාදක ප්‍රදාන | 1,577,000 | 1,313,786 | 263,214 |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 1,078,750 | 1,103,635 | (24,885) |
| (ඇ) | සාමූහික ප්‍රදාන | 7,595,670 | 8,221,279 | (625,609) |
| (ඈ) | වෙනත් ප්‍රදාන | 62,003 | 64,513 | (2,510) |
| | එකතුව | 10,313,423 | 10,703,213 | (389,790) |

2.13.2 පළාත් සංවර්ධන සැලැස්ම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ යටතේ රු.1,960,963,763 ක අගයකට වූ වැඩ යෝජනා 1573 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව, වැඩ යෝජනා වල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිම කළ | 898 | 245 | 1143 |
| 75% - 90% අතර නිම කළ | 52 | 24 | 76 |
| 50% - 75% අතර නිම කළ | 34 | 06 | 40 |
| 50% කට වඩා අඩුවෙන් නිම කළ | 40 | 12 | 52 |
| ආරම්භ කර නොතිබූ | 262 | - | 262 |
| එකතුව | 1286 | 287 | 1573 |

2.13.3 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ අරමුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපයේ පසුගිය වර්ෂ 05 ක කාලය තුළ 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සියළුම සිසුන් අසමත් පාසල් 24 ක් වූ අතර, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්වීමේ ප්‍රතිශතය සියයට 38 ක් වී තිබුණි. අ.පො.ස. (උ.පෙළ) කලා විෂයයන් පාසල් 18 ක ද , වාණිජ විෂයයන් පාසල් 14 කද, විද්‍යා විෂයයන් පාසල් 06 කද, ඉගැන්වීම සිදුකර තිබුණු අතර සමත්වීමේ ප්‍රතිශතය කලා සියයට 60 ක්, වාණිජ සියයට 46 ක්, විද්‍යා සියයට 26 ක් විය.

(ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සහ උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෘජුවම සමාලෝචිත වර්ෂයට අදාළව පැවැත්විය යුතුව තිබුණු විභාග 16 ක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් පවත්වා නොතිබුණු අතර, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග ඒකකයක් ස්ථාපිත නොකර සමාලෝචිත වර්ෂයේ විභාග 08 ක් පවත්වා තිබුණි. එම නිසා විභාග ප්‍රශ්න පත්‍ර සැකසීමේ දී රහස්‍යභාවය ආරක්ෂා වීම තහවුරු වී නොතිබුණි.

2.14 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.

2011 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු.6,527,759 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 කට අදාළව එදිනට අත් කරගෙන තිබුණු ප්‍රගතිය සියයට 20 ත් සියයට 50 ත් අතර විය.

2.15 අරමුදල් ඌන උපයෝජනය.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභාව විසින් රැස්කරනු ලබන ආදායම් සහ රජයෙන් ලැබෙන මූලධන ප්‍රදාන උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායී ලෙස අප්‍රමාදව හා ආර්ථිකභාවයෙන් යුක්තව පළාතේ සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීම මූල්‍ය පාලන බලධාරීන්ගේ වගකීම වන නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී පළාත් සභාව වෙත ලැබී තිබුණු රු.2,717,753,130 ක මූලධන ප්‍රදාන වලින් සහ ඉකුත් වර්ෂ ගණනාවක සිට ලැබී තිබුණු ප්‍රදාන වලින් අදාළ සංවර්ධන කාර්යයන් සඳහා යොදා නොගැනීම නිසා ඉතිරි වූ රු.820,738,488 ක් පළාත් සභාව විසින් විවිධ රාජ්‍ය බැංකුවල ස්ථාවර තැන්පතු ගිණුම්වල ආයෝජනය කිරීමට කටයුතු කර තිබුණි. එකී ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ ලැබී තිබුණු මූලධන ප්‍රදාන වලින් සියයට 30 ක් වූ අතර, පළාත් සභා අරමුදල් ඌන උපයෝජනයට ලක් කිරීම මූල්‍ය පාලන දුර්වලතාවයක් බව අවධාරණය කෙරේ.

(ආ) ගුණාත්මක යෙදවුම් මිලට ගැනීමට හා උසස් මට්ටමේ අධ්‍යාපන ක්‍රියාවලීන් සඳහා හිඟුරක්ගොඩ අධ්‍යාපන කලාපය වෙත ලබාදී තිබුණු මුදලින් රු.5,937,355 ක් අදාළ අරමුණු වෙනුවෙන් වැය නොකර පාසල් බැංකු ගිණුම්වල නිශ්ක්‍රීයව පැවතුණි.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලයේ 609 ශීර්ෂයේ වැය විෂයයන් 02 කින් රු.5,762,000 ක ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශයේ පොළොන්නරුව උප කාර්යාලයේ උද්‍යාන අලංකරණය හා වායු සමනය කිරීමට සහ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලට ගැනීම සඳහා නිදහස් කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහත සඳහන් කාර්යයන් සඳහා 2011 වර්ෂයට ප්‍රතිපාදන සලසා නොමැතිවීම මත මෙම ප්‍රතිපාදන නිදහස් කර ඇති බව දක්වා තිබුණත් 606 වැය ශීර්ෂයට අදාළව පර්පූරක ඇස්තමේන්තුවක් සම්මත කරගෙන එකී කාර්යයන් ඉටුකර ගත හැකිව තිබුණි. එසේ කටයුතු නොකර 606 වැය ශීර්ෂයේ කාර්යයන් සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යොදවා ගැනීමෙන් එහි ප්‍රතිපාදන ඌන උපයෝජනයක්ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන අතිරික්ත උපයෝජනයක්ද සිදුකර තිබුණි. නිසි පුරෝකථනයක් සිදු නොකර 609 ශීර්ෂයට අධි ප්‍රතිපාදන වෙන්කර ගැනීම සහ 606 ශීර්ෂයට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන්කර නොගැනීම ගිණුම් මගින් නිරූපනය වීම වළක්වාලීම සඳහා මෙසේ ප්‍රධාන ලේකම් කාර්යාලයේ අතිරික්ත ප්‍රතිපාදනයන් වෙනත් අරමුණු සඳහා යොදවා නැතැයි විගණනයේදී බැහැර කළ නොහැක.

(ඈ) වැය විෂයය 610-8-2-2501/23 - වෙනත් සඳහා රු.1,615,000,000 ක පර්පූරක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් එහි මුළු වියදම රු.815,718,684 ක් වූ අතර, එකී වියදම් මුළුමනින්ම ගංවතුරින් හානියට පත් පළාත් මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ වැය කර තිබුණි. ඒ අනුව මෙම පර්පූරක ඇස්තමේන්තුව

608 ශීර්ෂ යටතේ වෙන් කර ගත යුතුව තිබුණු බවත්, පළාත් භාණ්ඩාගාරය, නිසි පුරෝකථනයකින් තොරව පරිපූරක ඇස්තමේන්තු අනුමත කරවාගෙන ඇති බවත්, තම අරමුණු වලට පටහැනිව කටයුතු කර ඇති බවත් අවධාරණය කෙරේ.

3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය.

3.1 සංයුක්ත සැලැස්ම

රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) හා 2010 මාර්තු 10 දිනැති චක්‍රලේඛ ලිපිය ප්‍රකාරව පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් ඒවායේ මෙහෙවර හා කාර්ය භාරයන්ට අදාළව සංයුක්ත සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

3.2 ක්‍රියාකාරී සැලැස්ම.

පළාත් සභාව සහ එහි එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැසුම් පිළියෙල කර නොතිබුණි.

3.3 අභ්‍යන්තර විගණනය.

උතුරු මැද පළාත් සභාවේ අභ්‍යන්තර විගණන හා විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් වන පළාත් සභාවේ ආයතන වල වැරදි හා වංචා වැළැක්වීම සහ වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හඳුන්වා දී ඇති අභ්‍යන්තර පාලන ක්‍රමවල සඵලත්වය පරීක්ෂා කිරීමත්, ඒවායේ දුර්වලතා මගහරවා ගැනීමට උපදෙස් දීමත් සිදු කර ඇති බව ඔවුන් විසින් නිකුත් කර ඇති විගණන විමසුම් අනුව නිරීක්ෂණය නොවුණු අතර, දෙපාර්තමේන්තුවේ දිගුකාලීනව පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු 05 ක් සම්පූර්ණ නොකිරීමද එකී අරමුණු ඉටු කර ගැනීමට හා ප්‍රමාණවත් කාර්ය සාධනයක් පවත්වා ගැනීමට බාධාවක් වී තිබුණි.

3.4 විගණන හා කළමනාකරණ කමිටු.

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු යටත් පිරිසෙයින් කාර්තුවකට එක් වරක් හෝ පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී පළාත් සභාවේ එක් එක් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් එකී කමිටු රැස් කර තිබුණේ එක් වරක් පමණි.

3.5 ප්‍රසම්පාදන සැලැස්ම.

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් 2011 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් පිළියෙල කර නොතිබුණි.

4. පද්ධති හා පාලන.

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය.
(ආ) ආදායම් පරිපාලනය.
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඈ) ස්ථාවර වත්කම්.
(ඉ) අරමුදල් උපයෝජනය.
(ඊ) මානව සම්පත් කළමනාකරණය.
(උ) ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(එ) ගබඩා පාලනය
(ඒ) පැමිණීම හා අතිකාල පාලනය